# ලංකාආණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 6,956 — 1918ක්වූ ජූලි මස 12වෙනි දිනවූ සිකුරාද.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද ප්‍රකාශපත්‍රයයි.

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයත් යන එක්සත් රාජධානියේද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රටවලද රාජාභිෂේකලත් සමය සංරක්ෂකවූ නොයෙකශ්‍රීන් විරාජමානවූ පස්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්ය.

සෙන්ට් මයිකල් සහ සෙන්ට් ජෝර්ජ් යන අතිවිශිෂ්ට පඞ්ක්තියේ සාමාජික ධුරන්ධර ලංකාද්වීපයේ සහ
ඊට යටත් ප්‍රදේශවල ආණ්ඩුකාර ධුරන්ධර රෙජිනෝල් එඩ්වඩ් ස්ටබ්ස්
උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද

ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

ආර්. ඊ. ස්ටබ්ස්.

වර්ෂ 1910යේ නාගරික සභා ආඥාපණතේ 109 (1) සහ 110 (15) වෙනි කාණ්ඩවල පංගාධම් ප්‍රකාර කොළඹ නාගරික සභාව විසින් වර්ෂ 1910යේ සැප්තැම්බර් මස 2වෙනි දින "සිනිමැටොග්‍රැෆ්ස් සහ වෙනත් රූප දක්වීම්" යන නමින් ප්‍රකාශපත්‍රයකින් එළිදරව්කර තිබුන උපාධ්‍යනීති වෙනුවට සාදනලද මෙහි පහත දක්වන උපාධ්‍යනීති එම ආඥාපණතේ 109 (3) වෙනි වගන්තියේ නියමකර තිබෙන ප්‍රකාර කාරක මන්ත්‍රීසභාවේ කැමැත්ත ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිර කරණලද්දේය.

එබැවින් එම ආඥාපණතේ 109 (3) වෙනි වගන්තියෙන් ආණ්ඩුකාරතුමා වන අපවෙත පවරා තිබෙන බලය කරණකොටගෙණ එකී උපාධ්‍යනීති මෙයින් එළිදරව්කර සිටින බවත් මෙහි සඳහන්කර තිබෙන දින පටන් සහ ඊට පසුත් එය වලංගුවීමට පැමිණෙන බවත් ප්‍රකාශකර සිටිම සියළුදෙනා විසින් දතයුත්තේය.

අප ස්වාමීන්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය දහඅටක්වූ ජූනි මස විසිඑක්වෙනි දින එම ලංකාද්වීපයේ කොළඹදී දෙවාවදාරණලද්දේය.

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

ඊ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරීස් වර්ෂ.

රජතුමාණන් දෙවියෝ රකිත්වා.

---

### කියනලද උපාධ්‍යනීති.

මෙහි පහත දක්වන උපාධ්‍යනීති යම් ප්‍රසිද්ධ ක්‍රීඩාවක් දක්වනකල එහි සිතියම් පෙන්වීමකදී හෝ සිනිමැටොග්‍රැෆ් නමැති යන්ත්‍රයකින් මැජික් ලංතෑරුමකින් හෝ එබඳු වෙනත් භාණ්ඩාදියකින් දෘෂ්ටිය සම්බන්ධ පෙන්වනදේ දක්වීමකදී හෝ නැටුම් මායිම් විජ්ජා පිනුම් දක්වීමකදී හෝ වෙනත් ස්ටේජ් එකකින් පෙන්වාදෙන සෙල්ලමක් දක්වීම යනාදි ප්‍රසිද්ධ ක්‍රීඩාවල් සම්බන්ධව භාවිතාවේ.

### අර්ථ විස්තරකිරීම.

"ලයිසන්සි" යන්නෙන් 4වෙනි නියෝගයේ ප්‍රකාර ලයිසන්ස් එක හෙවත් අවසරපත්‍රය අත්සන්කල අය හෝ අයවළුන් හැටියට තේරුම්ගත යුතුය.

"චෙයාර් මැන්" යන්නෙන් කොළඹ නාගරික සභාවේ සභාපතිතුමා හැටියට තේරුම්ගත යුතුය.

### අවසර ගතයුතු ගොඩනැගිලි.

1වෙනි නියෝගය.—කිසිකෙනෙකුට යම් ගොඩනැගිල්ලක් කොරෙට්ටුවක් හෝ ස්ථානයක් ප්‍රසිද්ධ ක්‍රීඩාවක් පෙන්වීම සඳහා ඒ ගැන අවසරපත්‍රයක් ලබානොගෙන පාවිච්චිකරන්ට හෝ එසේ පාවිච්චිකරන්ට ඉඩවත්දෙන්ට බැරිය. තවද අවසර පත්‍රයක් ලබාගත් කෙනෙක් එහි කියා තිබෙන පොරොන්දු කඩකර හෝ මෙම නියෝග කඩකර පාවිච්චිනොකළ යුතුය. ඊට ඉඩවත් නොදිය යුතුය.

2වෙනි නියෝගය.—එබඳු ස්ථානයක් විවෘතකිරීමට බලයගන්ට කැමැතිව සිටින සියළුදෙනා පළමුවෙන් එය විවෘත කරන්ට අදහස්කර සිටින ස්ථානයේ ප්‍රසිද්ධ පාරට පැහැදිලිව පෙනෙන ලෙස දැන්වීමක් ලෑල්ලක දක්වා තැබියයුතුවත් ඇර එම පලාතේ භාවිතාකරණ ප්‍රසිද්ධ ආරංචිපත්‍ර තුනක දැන්වීමක් ප්‍රසිද්ධකළ යුතුය. ඉන්පසු සභාපතිතුමාට ලියවිල්ලක්දී ඉල්ලුම් කළ යුතුය. සභාපතිතුමා ඒ ගැන තීන්දු කල්පනාවකට පැමිණෙනතුරු දැන්වීම දක්වා තිබෙන ලෑල්ල පවත්වාගත යුතුය. එම ස්ථානයේ දක්වා තිබෙන දැන්වීමේ කොපියක් සහ දැන්වීම ප්‍රසිද්ධකර තිබෙන ආරංචිපත්‍ර ලැබී දෙසතියක් ඉකුත්වෙනතුරු, සභාපතිතුමා ඉල්ලුම්පත්‍රය ගැන කල්පනා නොකරණු ලැබේ.

කියාසිටීම.—යමෙකුගේ ඇති අයිතිවාසිකමේ අනුමත් තරමත් එම ස්ථානේ පවත්වන්ට අදහස්කර සිටින ක්‍රියාවේ අනුමත් ඉල්ලුම්පත්‍රයේ අඩංගුකළ යුතුය.

අඩියක ප්‍රමාණය අඟලකින් ⅛ පංගුවක ප්‍රමාණය දක්වා සිතියම් අඳින රෙද්දේ ඔපනැති පැත්තේ ඇඳ ප්ලෑන, පොලවේ උස, කොටස් යනාදිය දක්වා සම්පූර්ණ ප්ලෑන් දෙකක් බැගින් ඉල්ලුම්පත්‍රය සමග යැවිය යුතුය. තවද එම ස්ථානයට කිට්ටුව තිබෙන ඉඩම්වලට සහ එය තෙරපී තිබෙන ප්‍රසිඬ පාරවල්වලටත් පිහිටාතිබෙන අනුමත් දක්වා වේන් එකක ප්‍රමාණය අඟලකින් දක්වා ඇඳපු ගොඩනැගිල්ලේ ප්ලෑනෙන් වෙනම සිතියමක්මෙන් යැවිය යුතුය.

එම ඉඩමේ කාණු සාදන්ට යන ප්ලෑනෙත් පලුවක සිතියමක් එමවිටම ඔප්පුකළ යුතුයි, තවද එම ප්ලෑනේ එම කාණු එකතුකරන්ට යන මහකාණුව හෝ කාණුත් පෙන්විය යුතුය. කාණු සාදන්ට යන පැත්තේ පාරේ මට්ටමද, ඉඩමේ පහතම භූමියේ මට්ටමත් මහකාණුවේ සහ කාණුවල මට්ටමත් පෙන්විය යුතුය.

ගොඩනැගිල්ල සාදන්ට ගන්න සියලු ද්‍රව්‍ය තෝරාගැනීම පිණිස සිතියම් පාටකළ යුතුය.

සෑම සොල්දර නට්ටුවල පළලත් ඒවා තිබෙන පඩිවල ගණනත් මුවාකල දිසිමාගීවල (කොරිඩර්ස්) සහ ආසන අතරින් ඇති (ගැංවේස්) මාගීවල සහ දොරකඩවල්වල පළලත් පේළිවල උසත් එහි තිබෙන අනිත් කාණ්ඩත් සිතියම්වල පෙන්විය යුතුය.

බිත්තිවල ඝනකම සහ අනෙක ද්‍රව්‍යවලින් සාදා තිබෙන වැඩකෑලි පැහැදිලි ලෙස ඉලක්කම්වලින් දක්වා සිතියම්වල පෙන්විය යුතුය.

සෑම ප්ලෑනවලම සතර දික්භාගය දක්වා රේඛා දක්විය යුතුය. එම ඉඩමේ එක එක පැතිවල ඉන්ට දෙන මිනිසුන්ගේ ගණන සහ එක අයෙකුට ඉන්ට දීමට නියමකර තිබෙන ප්‍රමාණයත් ප්ලෑන්වල පෙන්විය යුතුය. මෙම නියෝගවලට ඒත්තු වෙන අන්දමට පාවිච්චිකරන්ට යන ද්‍රව්‍යවල සහ ගොඩනැගිල්ල සාදන්ට යන අන්දමත් විස්තරකර ඒ සමග යැවිය යුතුය.

## ලයිසන්පත්‍ර දීම.

3වෙනි නියෝගය.—සභාපතිතුමාට ලයිසන්ස් හෙවත් අවසරපත්‍රයක් දීමට ඉල්ලුම්පත්‍රයක් ලැබුනකල ඔහුට කල්පනා වෙන හැටියට ඕනෑකරණ විභාග කලාට පසු 5වෙනි නියෝගයේ නියමකර තිබෙන ප්‍රකාර මුදල් ගෙව්විට ඔහුට සුදුසුයයි සිතෙන පොරොන්දු පිට අවසරපත්‍රයක් හෙවත් ලයිසන්ස් එකක් දියහැකිය.

මෙම නියෝග පිට දෙනලද ලයිසන්ස් හෙවත් අවසරපත්‍රයක් කල්පනාවෙන හැටියට ඕනෑවිටක අහක්කරන්වත් කල කට නවත්වන්ටත් එහි බලය අඩුකරදමන්ටත් සභාපතිතුමාට පුළුවන්කම තිබේ.

යම් ගොඩනැගිල්ලකට පහතින් හෝ වෙන ගොඩනැගිල්ලක කොටසකට උඩින් සාදන ස්ථානයකට අවසරයක් හෝ ලයිසන්ස් එකක් නොදෙනු ලැබේ. තවද එහි පදිංචිවීමට කාමරද තිබෙන්ට බැරිය.

බිම සිට ගැලරියත් සමග පෙලවල් දෙකකට වැඩිය ඇති ස්ථානයකට ලයිසන්ස් පත්‍රයක් නොදෙනු ලැබේ. (35 ගණන කට වැඩිය පෙලවල්වල බැවුම තිබිය යුතුය.)

4වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් දෙන අවසරපත්‍රය මෙහි යාකර තිබෙන A අක්ෂරය දරණ ෆෝර්මය අන්දමට ඕනෑකරයි. එහි ලයිසන්ස් ලත් අයගේ නම සහ ඉන්නතැනත් ඉඩම පැවතී තිබෙන අන්දමත් විස්තරත් මතුපිට ඇති විශාල කමත් එකවතාවකට ඇතුල්කරන අයවළුන්ගේ ගණනත් පිටතට යන්ට සාදාතිබෙන දොරකඩවල්වල ගණනත් එම ස්ථානය ඇර තිබෙන වේලාවල් සහ එය පාවිච්චිකරන්ට ඕනෑ කරුණුත් අවසරපත්‍රය වලංගු කාලයත් අවසරය ඉවරවෙන දිනත් ඇති විශේෂ පොරොන්දුත් විස්තරකළ යුතුය. අවසරපත්‍රය එක්ක ඒ සමාන තවත් එකක් දෙනුලැබේ. එකක "ඔරිජිනල්" යන්නද අනිකේ "ඩුප්ලිකේට්" යන්නද ලකුණුකරනු ලැබේ. 'ඔරිජිනල්' එක අවසරපත්‍රකාරයාට දෙනුලැබේ. ඔහු එය තමුන් ලඟ තබාගත යුතුයි. 'ඩුප්ලිකේට්' එක සභාපතිතුමා විසින් අමුනා තබාගන්නා ලැබේ. 'ඔරිජිනල්' සහ 'ඩුප්ලිකේට්' යන අවසරපත්‍ර දෙකේම අවසරපත්‍රකාරයා අත්සන්කළ යුතුය.

## ගාස්තු.

5වෙනි නියෝගය.—මෙහි පහත දක්වන ගණන් පිළිවෙළේ හැටියට අවසරපත්‍රයක් දෙන්ට මත්තෙන් ඉල්ලුම්කාරයා විසින් ගාස්තු ගෙවිය යුතුය.

### A. කළාසිය.

| | රු. |
|---|---|
| 500 දෙනෙකුට හෝ ඊට වැඩිදෙනෙකුට ඉඩුම්දීමට එක අවුරුද්දකට දෙන අවසරපත්‍රයට, (දෙසැම්බර් මස 31වෙනි දිනෙන් ඉවරවේ) .. .. .. | 500 |
| එක මාසෙකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 100 |
| එක දවසකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 10 |

### B. කළාසිය.

| | |
|---|---|
| 200 දෙනෙකුට හෝ ඊට වැඩිදෙනෙකුට ඉඩුම්දීමට එක අවුරුද්දකට දෙන අවසරපත්‍රයට, (දෙසැම්බර් මස 31වෙනි දිනෙන් ඉවරවේ) .. .. .. | 250 |
| එක මාසෙකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 50 |
| එක දවසකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 5 |

### C. කළාසිය.

| | |
|---|---|
| 200 දෙනෙකුට වඩා අඩු ගණනකට. ඉඩුම්දීමට එක අවුරුද්දකට දෙන අවසරපත්‍රයට, (දෙසැම්බර් මස 31වෙනි දිනෙන් ඉවරවේ) .. .. .. | 125 |
| එක මාසෙකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 25 |
| එක දවසකට දෙන අවසරපත්‍රයට .. .. .. .. | 2·50 |

## වරදදේ හරිගැස්සීම.

6වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් කලින්කලට එබඳු ඉඩම් සෝදිසිකර බැලීමට නියමකරණු ලැබේ. එසේ සෝදිසිකර බැලීමෙන් මෙම උපාධගනිතිවල කියා තිබෙන කාරණාවලට විරුඬවූ යම් වැරැද්දක් හෝ අපිළිවෙළක් දකින්ට ලැබුනිනම් ඔහු විසින් ලියාදන්වා ඇර අයිතිකාරයාගෙන් හෝ බදුකාරයාගෙන් එබඳු වරදවල් නියමකරණ කාලයක් තුළ සභාපතිතුමා සතුටුවෙන අන්දමට හරිගස්සනමෙන් ඕනෑකරවනු ලැබේ. එවැනි අයිතිකාරයා හෝ බදුකාරයා එය කිරීමට බැඳිසිටින බව දතයුතුය.

## වෙනස්කිරීම්.

7වෙනි නියෝගය.—පළමුවෙන් සභාපතිතුමාගෙන් අවසර ගෙන මිස කිසි ස්ථානයක් පසුව වෙනස්කරන්ට බැරිය. එබඳු-ස්ථානවල වැඩිපුර යමක් සාදන්ට හෝ වෙනස්කරන්ට අදහස් ඇතිවේනම් ඒ බව සභාපතිතුමාට ලියවිල්ලකින් දක්වා සිටින්ට ඕනෑය. පළමුවෙනි වරට ඔහු ලවා සහතිකකරවාගන්ට සාදන ස්ථානවලටමෙන් සිතියම් උස කොටස් ඉඩමේ ප්ලෑනෙන් කරන්ට අදහස්කර සිටින වැඩවල විස්තරත් දන්වීම සමග යැවිය යුතුය. තවද එහි කරන්ට අදහස්කර සිටින වෙනස්කිරීම් සහ වැඩිපුර සාදන්ට යන දේත් පෙන්විය යුතුය.

ඕනෑකරණවානම් සභාපතිතුමාට අළුතෙන් ඉඩමේ මැනීමක් කරන්ට නියමකරන්ට පුළුවන.

## ගින්නෙන් ආරක්ෂාවීම.

8 වෙනි නියෝගය.—ගොඩනැගිල්ල සාදාතිබෙණ ද්‍රව්‍ය ගිනි ඇල්ලීමට හැකි වර්ගයක්දැයි දැනගැනීම සභාපතිතුමා හෝ ඔහු විසින් නියමකරණලද මූලාදෑනියෙක් විසින් තීන්දුකරණුලැබේ.

9 වෙනි නියෝගය.—එබඳු සෑම ඉඩම්වල පොළෝපෙළි ශ්‍රවනශාලාවේ වහල සහ පොදුජනයා විසින් පාවිච්චිකරණ සැමපැතිම සභාපතිතුමා සතුටුවෙන පරිද්දෙන් ගිනි ඇවිලීම වලක්වන අන්දමේ ද්‍රව්‍යවලින් සෑදිය යුතුය.

මෘදු ලී හෝ ගිනිඇවිලෙන්ට හැකි බිත්ති රෙදි වෙන්කරණ ද්‍රව්‍ය පැලලිහෝ ආවරණ එම ඉඩමේ මොනයම් පැත්තක වත් පාවිච්චිකරන්ට බැරිය. රෙදිවල පිටිපස්සේ විවර තිබෙන්ටත් බැරිය. තවද ස්ටේජ්එකේ සෑම ලීවැඩ ගිනිඇවිලෙන්ට බැරි අන්දමට සැලැස්විය යුතුය. නැතුවානම් ගිනිඅල්ලන්ට නොහැකි සවිබල ලී වියයුතුය.

ස්ටේජ්එකෙන් ශ්‍රවනශාලාව වෙන්කර තිබෙන කර්ටන් තිරේ එල්ලාඇති රාමුවත් සභාපතිතුමා විසින් ඒත්තුගන්ට යෙදෙන අන්දමේ ගිනිඇවිලීම වැලැක්විය හැකි ද්‍රව්‍යවලින් සෑදිය යුතුය.

10 වෙනි නියෝගය.—(a) අවසරපත්‍රකාරයා විසින් ගිනි නොඇල්ලීමට සහ ගිනි නිවීමටත් ඕනෑකරණ සෑහෙනතරම් ආයුධ සහ වතුරත් සපයන්ට හෝ සපයා තබ්බවන්ටත් ඕනෑය.

එම ඉඩමට ජලයන්ත්‍ර සහ දිගඇති වතුරනලත් සභාපතිතුමාට ඕනෑකරන අන්දමට සම්පාදනයකළ යුතුය.

11 වෙනි නියෝගය.—සභාපතිතුමාට ඕනෑකරණ අන්දමට වතුරනළ වතුරපිරූ බාල්දි කබිලි සමපාදනයකොට ඒ ඒ අන්දමට තබා ඔහු විසින් නියමකරන විධියට පෙනෙන්ට තැබිය යුතුය.

12 වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් ඒත්තුගන්ට යෙදෙන වගකියහැකි කෙනෙක් එම ඉඩමේ අයිතිකාරයා විසින් පඩිගෙවා ගිනිනිවාපණ ආයුධ භාරදී ඕනෑකළ කඩිනමකට සූදානම්ව සිටින්ට පත්කර සිටිය යුතුය.

13 වෙනි නියෝගය.—ගින්නක් හටගත්විට එල්ලාතිබෙන තිර පාතටගැණීම පිණිස ඕනෑකළ ඉක්මනින් පාවිච්චිකිරීමට අත්පොරෝ කොකු සහ වෙනත් උපකරණ සූදානම්ව තිබිය යුතුයි.

14 වෙනි නියෝගය.—එම ස්ථානයේ සිට ඉතාම කිට්ටුවම තිබෙණ ගිනිනිවාපණ ස්ටේෂමට ටෙලිෆෝන් කම්බියක් තැබීමට අයිතිකාරයාට හෝ බදුකාරයාට නියමකරන්ට සභාපතිතුමාට පුළුවන.

14A වෙනි නියෝගය.—පැට්‍රෝලියම් පැට්‍රොල් කැරසින්තෙල් කාර්බයිඩ් වෙඩිබෙහෙත් යනාදි ගිනිඇල්ලීමට හෝ පුපුරා පත්තුවීමට හැකි ද්‍රව්‍ය එකදවසකට ඕනෑකරණ තරමකට වැඩිය අවසරලත් ස්ථානේ නොතැබිය යුතුය.

මෙහි පහත දක්වන 15වේ සිට 22වෙනි එක දක්වා නියෝග එකක්හෝ ඊට වැඩිගණනක් ජෙල්ලිඇති සොල්දර ගොඩ නැගිලිවලට භාවිතානොවේ.

15 වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් ඒත්තුගන්ට යෙදෙන ගිනිගැන්ම වැලකියහැකි ද්‍රව්‍යයකින් සාදනලද හෙලන තිරයක් ස්ටේජ්එක ඉදිරියේ විවෘතකරණතැන සපයා තිබිය යුතුය. තවද එය අඩුවසයෙන් එක එක දක්වීමක් පැවැත්වූකල ස්ටේජ්එකේ පාතනවිට්ටුව එක්කම සම්පූර්ණයෙන් තිබෙන්ට හෙලන්ට ඕනෑය.

16 වෙනි නියෝගය.—සෑම තිර සහ ගිනිවලකන මූවාවත් කර්ටන් රාමුවේ ඇරීතිබෙන තැනට ඉහලින් සම්පූර්ණයෙන්ම නොඇඹරී ඉස්සීම පිණිස ස්ටේජ්එකෙන් ඉහල සෑහෙනතරම උසතියෙන්ට ඕනෑය.

ස්ටේජ්එකෙන් ඉහල වහලෙ ගිනිවලකන ද්‍රව්‍යවලින් හෝ බරඇතුව තිබෙන්ට නොසෑදිය යුතුය.

17 වෙනි නියෝගය.—කර්ටන් රාමුවත් සමග සාදන ස්ටේජ්එකක් ඇති සෑමතැන්වලට එම ස්ටේජ්එක ශ්‍රවණශාලාවෙන් වෙන්වෙන පිණිස අඟල් 15කට අඩුනොවනතරම් ඝනකමඇති ගල් බිත්තියක් සෑදිය යුතුය. තවද එම බිත්තිය වහලෙට ඉහලින් එක ඝනකමපිට අඩුතරමේ අඩිතුනක් උසට තිබිය යුතුය. එම උස වහලේ බෑවුමට කෙලින් මැනිය යුතුවත්ඇර ස්ටේජ්එකෙන් පහල තද අත්තිවාරමකට බිත්තිය සවිකළ යුතුය.

18 වෙනි නියෝගය.—කර්ටන් බිත්තියේ විවරය ඇරෙන්ට එම බිත්තියේ විවර තුනකට වඩා නොසෑදිය යුතුයි.

19 වෙනි නියෝගය.—එක විවරයක් හතරැස් අඩි 24කට වැඩිය මහත නොවිය යුතුය. එහි එක එක විවරයට දුනු නැතුව ඉබේම වැසෙන්ට හැකි තලාපු යකඩවලින් සෑදූ දොරවල් එල්ලීතිබීමට සවිකල යුතුය.

20 වෙනි නියෝගය.—අඳින කාමරවලට ගොඩනැගිලිවල වෙනම පැත්තක් පිළියෙළකරගන්ට ඕනෑය. එසේ නැත් නම් එය බිත්තිවලින් වෙන්කරගන්ට ඕනෑය. තවද ඊට සභාපතිතුමා ඒත්තුගන්ට යෙදෙන ප්‍රකාරයට පමනක් යන්ට එන්ට මාර්ග තබාගත යුතුය.

21 වෙනි නියෝගය.—එබඳු ඉඩමක තිබෙන බිඳියන්වාහැකි එලිය වැටෙන්ට වහලේ තබන වීදුරුත් ලංතෑරුම් එලි යත් සවිඇති ගැල්වනයිස්ඩ් යකඩවලින් සාදන කම්බිආවරනවලින් පිටපැත්තෙන් හොඳට සවිකර ආරක්ෂාකළ යුතුය.

22 වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් ඒත්තුගන්ට යෙදෙන දොරවල් ඇර ස්ටේජ්එකේ යටපැත්ත අඟල් 10කට අඩුනොවන ඝනකම ඇති බිත්තියකින් සම්පූර්ණයෙන් වසාදමන්ට ඕනෑය. කුනුකන්දල්වලින් සහ ගිනි අල්ලන්ට හැකි සෑම ද්‍රව්‍යවලින් එය හිස්කර සම්පූර්ණයෙන් ශුඹ ඇතුව තබන්ටත් ඕනෑය.

සිනිමැටොග්‍රෑප් නමැති ඡායාරූප දක්වන යන්ත්‍රය සම්බන්ධව ගිනි නොඇවිලීමට ගන්නා ආරක්ෂාවල්.

23 වෙනි නියෝගය.—(a) සිනෙමැටොග්‍රෑප්එක හෝ උපකරණ සභාපතිතුමා විසින් ලියවිල්ලකින් දෙනලද අවසර යක් නැතුව කාමරේ ඇතුලේ හෝ බලාසිටින අය ඉන්න ගොඩනැගිල්ලේ හෝ තබන්ට බැරිය.

(b) පුළුවන් තරමට ගිනි නොඇවිලෙන අන්දමට යන්ත්‍රයේ කෘත්‍යකරණ කාමරය සාදන්ට ඕනෑය. එහි දිග අඟල් 12කට වැඩිනොවන තරමේ විවරවල් තුනක් පමනක් තැබීමට ඉඩදෙනු ලැබේ. එයින් දෙකක් රූප ඉදිරියට දැමීමට සහ අනික කෘත්‍ය කරන්නාට අතරෙන් බැලීමටත්ය.

24 වෙනි නියෝගය.—(a) කෘත්‍ය කරණ කාමරේ ඇතුලේ ෆිල්ම්එකට (පිංතූරවැල) අඩි 6කට ඇතුලේ දුම්බොන්ට ඉඩදෙන්ට බැරිය.

(b) වියලිවැලි බාල්දියක් සහ කබිලියක් කෘත්‍යකරණ කාමරයේ නිතර තිබෙන්ට ඕනෑය.

25 වෙනිනියෝගය.—ප්‍රදර්ශනය දක්වන කාලය අතරේ එක වතාවකට කෘත්‍ය කරන්නත් සමග මිනිස්සු තුන්දෙනෙකුට වඩා ඉන්ට ඉඩනොදෙනු ලැබේ.

26 වෙනි නියෝගය.—ගොඩනැගිල්ල තුළ කෘත්‍ය කාමරේ පිහිටුවාගන්ට ඉඩදී තිබේනම් එහි සිට අඩි 6ක් අතරේ ආසන නොතැබිය යුතුයි.

27 වෙනි නියෝගය.—ක්‍රියාවට ඇත්තෙන්ම පෙන්වන්ට ඕනෑකරණ ෆිල්ම් පමනක් කෘත්‍ය කරන්නාගේ කාමරේ හෝ ස්ක්‍රීම තුල තැබිය යුතුය. ඉතුරුව තිබෙන ඒවා ප්‍රධාන ගොඩනැගිල්ලෙන් ඉවත්කරඅරින්ට ඕනෑය.

ෆිල්ම් ලංතෑරුම ඇතුලෙන් ගමන් නොකරණකල ලෝහ වැස්මවල ඇතුල්කර තැබිය යුතුය. ලංතෑරුම ඇතුලෙන් ගමන්කරණ ෆිල්ම් ලංතෑරුම ඉදිරියෙන් පිටවෙනකොටම ඉක්මනට අතින් හෝ යන්ත්‍රයකින් නවත් හිරඑවක නැවත ඔතන්ට ඕනෑය. එසේ නැත්නම් එය කෘත්‍ය කරන්නෙක් විසින් "ඇස්බැස්ටෝස්බෝර්ඩ්" (සිනිඳු රෙදි නොහොත් හුල් වර්ගයකින් සාදා තිබෙන ඝනකම් කඩදාසි) වලින් ඇතුල වසා තිබෙන ලොකු පෙට්ටියකට යවන්ට ඕනෑය. සභාපතිතුමාට ඕනෑකලේනම් එලියදෙන "ඉලියුමිනන්ට්" එකේ රස්නය වලක්වන පිණිස වීදුරු දීසියක සිනක්කාරන් වතුර සම්පූර්ණයෙන් පුරවා "කොන්ඩෑන්සර්" එක (හුමාලය දියාරු විධියකට පමුනුවන යන්ත්‍රය) ඉදිරිපිට තියෙන්ට සම්පාදනය කළයුතුයි.

28 වෙනි නියෝගය.—මෙම ඉඩම් සම්බන්ධව තිබෙන ඇන්ජින් ද්‍රවවන ඩයිනමෝස් (විදුලිය මැඩ පවත්වන යන්ත්‍ර) හුලං එන්ට සාදා තිබෙන කාමරවල හෝ ගිනි නොඇවිලෙන අන්දමට සාදා තිබෙන ගොඩනැගිලිවල තැබිය යුතුයි.

එබඳු කාමර සහ ගොඩනැගිලි එම ඉඩමෙන්ද කාමර එකිනෙකෙන්ද බිත්තිවලින් සහ ගිනි නොඅල්ලන ආකාරයට සාදා තිබෙන බිම්වලින්ද වෙන්කළ යුතුය. තවද එක පැත්තකින් හෝ වැඩි පැතිවලින් පිටින් බිත්ති සාදා කොරවූකර තැබිය යුතුය.

වාතය ගෙණදීම.

29වෙනි නියෝගය.—සභාපතිතුමා සෑහේයයි ඒත්තුගන්නා ආකාරයට එබඳු ස්ථානවල අවත්වාතය හමනලෙස සැලැස් වියයුතුය. ඊට අරින සෑම විවර ප්ලෑනේ දක්වන්ට ඕනෑවා සහ විස්තරත් කළයුතුය.

සෑම අඳින කාමරවල බිත්තිවල පිටින් ජනේල තැබියයුතුය.

ඇතුල්වෙන සහ පිටතට යනතැන්.

30 වෙනි නියෝගය.—එබඳු සෑම ඉඩම්වල 300 දෙනෙකුට වඩා ඉන්ටදෙන සෑම ජෙල්ලිවලට සහ බිම්වලින්ත් පිටතට යාමට දොරකඩවල් දෙකක් ඇතිවියයුතුය. 300කින් වැඩි 250කට හෝ 250කින් පංගුවකට වැඩිදෙනාට වැඩිදුර පිටතට

යන දොරකඩවල් තැබියයුතුය. එක පේලියක ඉන්ටදෙන ගණන ගණන්ගන්නකළ ප්‍රදර්ශණය හිටගෙණ බැලීමට සහ ඉඳගෙණ බැලීමටත් ඔනෑකරණ ඉඩ කල්පනාකළයුතුය. මේ කටයුත්තට අයෙකුට හිටගෙණ බැලීමට ඔනෑ ඉඩ හතරැස් අඩි 1½ක් හැටියට ගැණිය යුතුය.

31වෙනි නියෝගය.—ස්ටේජ්එකේ සිට කෙලින්ම පිටතට යාමට දොරකඩවල් දෙකක් සහ ඇඳුම් අඳින කාමරවල සිට පිටතට යාමට වෙන්වූ දොරකඩක් ඇතිවියයුතුය.

32වෙනි නියෝගය.—සෑම දොරකඩවල් අඩි පහකට අඩුනොවන තරමද අඳින කාමරවල දොරකඩවල් අඩි 4කට අඩු නොවන තරමද පලල ඇතිවිය යුතුය. තවද එය කෙලින්ම හිස් ඉඩමකට හෝ පාරකට හෝ ඇරීතිබෙන ස්තෝප්පුවකට හෝ පැමිණෙන්ට තිබියයුතුය. එහි බිම සෑමතැන්වලම පාන පොලොවේ මට්ටමේ සිට අඩි දෙකකට වඩා උස්නොවියයුතුය.

33වෙනි නියෝගය.—එබඳු ස්ථානවල පොදුජනයා විසින් පිටතට යාමට පාවිච්චිකරණතැන්ද වෙනත් දොරවල් සහ විවර සභාපතිතුමා සතුටුවෙන ආකාරයට අඟල් 7ක් මහතට පින්තාරුකරපු අකුරුවලින් යුත් දැන්වීම්වලින් දැක්විය යුතුය.

එකී දැන්වීම් පුළුවන් ස්ථානවල පොළොවේ සිට අඩුවශයෙන් අඩි 6කට සහ අඟල් 9කට උසින් දොරවල්වලට හෝ විවරවලට උඩින් පින්තාරුකළයුතුය.

පිටතට යන සෑම දොරකඩවල්වල විදුරුවේ "පිටතට යාම" යන වචන පින්තාරුකර තෙල් පෝච්චියක් සවිකරණලද ලාම්පුවක් එල්වියයුතුය. එහි පත්තුකරණ තෙල් කැරොසින් තෙල් නොව සෑරේට පත්තුනොවන තෙල්වර්ගයක් හෝ ඉටිපන්දමක් වියයුතුය. මෙම එක ලාම්පුවක්වත් පත්තුකිරීම ප්‍රධාන ගොඩනැගිල්ලේ පත්තුකරණ එළියට සම්බන්ධකමක් නොවියයුතුය.

34වෙනි නියෝගය.—පිටතට යනතැන් දොරවල්වලින් වසනුලැබේනම් එය පිටතට අරිනලෙස තැබියයුතුය. ඇරත් පහසුවෙන් ඉක්මනට ඇතුලෙන් තල්ලුකර අරින්ට පුළුවන් ආකාරයට සෑදියයුතුය.

35වෙනි නියෝගය.—ඇතුල්වෙනතැන්වලට පාවිච්චිකරණ සෑම දොරවල් සහ ගේට්ටු පිටතට ඇරෙනලෙස සෑදිය යුතුය. දෙපැත්තටම ඇරෙන්ට සෑදුවේනම් ඇතුල්පැත්තට ඇරියකළ යතුරකින් විවෘතකිරීමට ඔනෑ අන්අමට නැවත බිත්තියට අගුල්දමන්ට එය සවිකළයුතුය.

36වෙනි නියෝගය.—පිටතට යන මාර්ගවලින් සොල්දර තට්ටුවලින් හෝ දිර්ඝමාර්ගවලින් එම ඉඩමේ වෙනත් පැතිවලට යන්ට තිබෙණ දොරවල් දර්ශනශාලාවේ සිට වීථියට යන සෙනගගෙන් වැසෙන අන්දමට දුනුවලින් සවිකර එල්ලා තැබියයුතුය.

37වෙනි නියෝගය.—සෑම ආවරණ පිටතට ඇරෙන්ට හෝ පැද්දීයන්ට සෑදියයුතුය. ඊට ඒත්තුගන්නාලද අගුල්ඇර වෙන සවිකරණ දෙයක් නොගතයුතුය.

38වෙනි නියෝගය.—සෑම දොරවල් ඇරියකළ ආසන අතරින් ඇති මාර්ගයකට සොල්දර පඩි පේලියකට හෝ බහින තැනකට අවහිරයක් නොවනලෙස එල්ලියයුතුය. දොරවල් ඇරියකල අල්ලන මිටවල් සහ වෙනත් සවිකර තිබෙණ දේ පිටතට යන මාර්ගවලට අඟල් 1½කට වැඩිය තල්ලුවී නොතිබියයුතුයි.

39වෙනි නියෝගය.—මෙහි ඉහත සඳහන්කළ දේ ඇර පිටතට යන මාර්ග අවහිරවෙන යතුරු අගුල් දොර පොලු හෝ වෙනත් එබඳු දේ දොරවල්වල හෝ ගේට්ටුවල හෝ ආවරණවල සවිනොකළයුතුය.

දිර්ඝමාර්ග (කොරිඩර්ස්) සහ යනෙන මාර්ග.

40වෙනි නියෝගය.—පෙළක හෝ බිමක සිට යන දිර්ඝමාර්ගවල සහ යනෙන මාර්ගවලත් එකපෙළක හෝ බිමක 250කට වඩා ඉන්ට හැකිනම් පලල අඩි 5කටද 250කට වඩා 500දෙනෙකුට වැඩිනොවේනම් එහි පලල අඩි 10කටද අඩුනොවියයුතුය.

තවද පෙළක හෝ තට්ටුවක 500දෙනෙකුට වඩා ඉන්ට නොහැකිනම් පිටතට යාමට තුන්වෙනි දොරකඩක් සපයා ඇත්තේනම් දිර්ඝමාර්ග සහ යනෙන මාර්ගත් අඩි 5ට වැඩිය පලල්ව තිබෙන්ට ඔනෑ නැත.

පෙළක හෝ තට්ටුවක 500 දෙනෙකුට වඩා ඉන්ටහැකිනම් එකල 500යෙන් ඉහල 250කට හෝ එයින් කොටසකට එහි සිට යන්ට තිබෙණ දිර්ඝමාර්ගවලට සහ යනෙන මාර්ගවලටත් වැඩිපුර අඩි 5ක් පලල වැඩිකළයුතුය. පුළුවන්තැන්වලට පඩි වෙනුවට බෑවුම් පාවිච්චිකරන්ට පුළුවන.

41වෙනි නියෝගය.—සෑම දිර්ඝමාර්ග සහ යනෙන මාර්ගත් සම්පූර්ණයෙන් නිදහස්ව තැබියයුතුය. ඇඳුන් තියන කාමරයක් හැටියට පාවිච්චිකරන්ටවත් වෙන අන්දමකින් අවහිරවෙන හැටියට තබන්ටවත් බැරිය.

42වෙනි නියෝගය.—දිර්ඝමාර්ගවල සහ යනෙන මාර්ගවලත් පොළොවේ සිට අඩි 5ක් ඇතුළත බිත්තිවල කුහර හෝ පිටට පැන සිටින දෙයක් තියෙන්ට බැරිය.

43වෙනි නියෝගය.—300දෙනෙකුට වැඩිය ඉන්ට හැකි පේළිවලින් පිටතට යන දොරකඩවල් ඇතිවේනම් මිනිසුන්ට පාවිච්චිකරන්ට අදහස්කර තිබෙන සොල්දර තට්ටුවේ ඉතාමක්ම පටුතැන ඉතා අඩු වශයෙන් අඩි 5ක් පලලද එසේම 300 දෙනෙකුට වඩා වැඩිනම් ඉතා අඩුවශයෙන් අඩි 7ක් පලලද වියයුතුය.

44වෙනි නියෝගය.—පඩි තුනකින් අඩුනොවන හෝ පඩි 15කින් වැඩිනොවන පෙළවල්වල අඩිය තබන ලෑලි අඟල් 11ක් පළලට සහ එක පඩියක සිට අනිත් පඩියට උස අඟල් 6ක් ඇතුව සෑම ඉහලලෑලි පහත ලෑලිවල අද්දරින් අඩු වශයෙන් අඟලක් පමණ පිටතට පැනසිටින්ට තබා වෙන අංශවලට නොහරවා සෑම සොල්දර තට්ටුවලට අඩිය තබණ ලෑලි සම්පාදනය කළයුතුය.

45වෙනි නියෝගය.—සොල්දරේට නගින තට්ටුවේ පඩි 15කින් යුක්ත පෙළවල් දෙකක් නැමීමක් නැතුව නොතැබිය යුතුය. එකී පෙළවල් අතරේ බහින්ට තිබෙන තට්ටුවේ ගැඹුර අඩු වශයෙන් සොල්දර තට්ටුවක පඩියක මෙන් පලල්වියයුතුය.

46වෙනි නියෝගය.—බහින තට්ටුවල සහ පඩි දෙපැත්තේම දිගටම නැවැත්වීමක් නැතුව බිත්තියේ සවිකරණලද ලෝහබ්‍රැකට් හෙවත් කුරුපාවල ආධාරපිට පීලි සවිකළයුතුය. තවද එම පීලි සහ බ්‍රැකට් අඟල් 3කට වඩා පිටට තල්ලුවී නොසිටියයුතුය.

47වෙනි නියෝගය.—විවෘතකළවිට එකහෙලා පඩිපෙළකට බහින්ට දොරක් නොතිබියයුතුය. එබඳු පඩිවලටත් දොර කඩටත් අතරේ අඩුවශයෙන් අඩිතුනක දිග ඇති තට්ටුවක් සෑදියයුතුය.

ආසන තැබීම.

48වෙනි නියෝගය.—ශ්‍රවනශාලාවේ සෑමපැතිවලම පිට හෝ අත්නැති අශනයක (පුටුවක) ඉන්වදෙන මහන ගැඹුරෙන් අඩි 2ක් සහ පලලින් අඩියකුත් අඟල් 6කට අඩුනොවියයුතුය. අත් සහ පිට ඇති ආසනවලට මහත ගැඹුරෙන් අඩි 2ක් සහ අඟල් 4ක්ද පලලින් අඩියක් සහ අඟල් 8ක්ද අඩුනොවියයුතුයි එසේවුනත් සෑම කරුණුවලදීම එක ආසනයක ඉස්සරහ සිට ඊට ඉදිරියෙන් තිබෙන ආසනයේ පස්සෙන් කෙලින් මැන්නකල අඩුවශයෙන් අඩියක් ගැඹුරෙන් ඉඩතිබියයුතුය. සවිකරපු ආසනතැතුව දාවූ පාවිච්චිකරණ තැන්වල (පෙට්ටිඇරෙන්ට) පුටුවලට අත්තිබේනම් අඩියකුත් අඟල් 8ක් මැදින් මැදදුර ඇතුව ලෑල්ලක එකට එක සවිකළයුතුය. තවද අත් නැත්නම් අඩියකුත් අඟල් 6ක් දුර ඇතුව එකට සවිකළ යුතුය. ඊට දිගපුටු 6කට අඩුනොවන තරමේ වියයුතුය.

49වෙනි නියෝගය.—එක ආසන කට්ටියකට අතරෙන් සභාපතිතුමා සතුටුවෙන ප්‍රකාර අඩි 3ක අඩුනොවන පලල ඇති මාර්ග සම්පාදනය කළයුතුය.

එලියකිරීම.

50වෙනි නියෝගය.—ඉලෙක්ට්‍රික් හෝ ගෑස් එලියෙන් ආලෝකකරණ ස්ථානවලට වැඩිපුර එළිය කිරීමට මාර්ග සලස්සා ගතයුතුය. ශ්‍රවනශාලාවෙත් දිර්ඝමාර්ගවල යනෙන මාර්ගවල පිටතට යන තැන්වල සහ සොල්දර තට්ටුවලත් පාවිච්චිකරණ ලෙස සභාපතිතුමා විසින් ඒත්තුගන්නා මාදිරියක සෑහෙන තරමක් තෙල් ලාම්පු සම්පාදනය කළයුතුය. එය ගිනි නොගන්නා අන්දමේ තට්ටුවකට හොඳට සවිකර අරක්ෂාකර පුළුවන්කම තිබේනම් පොදු ජනයාට ලංවෙන්ට බැරිතරම දුරින් තැබිය යුතුය. තවද එය ජනයා එම ස්ථානයේ ඉන්නතුරු පත්තුවී තිබෙන්ට ඔනෑය.

අවසරලත් ස්ථානය තුළ එලි ලෝහ කඹි හෝ පොලුවලින් ඇර වෙන පැද්දෙන විධියේ එල්ලා නොතැබිය යුතුයි.

70 වෙනි නියෝගය.—සෑම විදුලි මාර්ග ඕනෑ තරමට බෙදිය හැකිය. සිනිමැටොග්‍රැප් ආර්ක් එළි දෙන මාර්ග ඇර බෙදූ විදුලි මාර්ග ඇම්පියර්ස් 10කට වැඩි නොවිය යුතුවත් ඇර ඩබල් පෝල් ෆියුස් එකකින් සහ ස්විච් එකකින් එය මැඩ පවත්වාගත යුතුය.

71 වෙනි නියෝගය.—මුලින් අවසර දුන් කටයුත්තට ඕනෑනොකරණ්වානම් සෑම එවකටගත් වැඩ අස්කළ යුතුය. තවද කලකට පමණක් පිහිටුවාගත් ඉලෙක්ට්‍රික් කර්මාන්ත තුන්මාසයකට වැඩි කාලයක් තබාගනොගත යුතුය.

72 වෙනි නියෝගය.—කලකට පමණක් පිහිටුවාගත් ඉලෙක්ට්‍රික් කර්මාන්ත ගැණ සෑම ප්‍රස්ථාවලදී විශෙෂ වශයෙන් කර තිබෙන පොරොන්දු සභාපතිතුමා කැමැත්තදී තිබෙන ලියවිල්ලට ඍකළ යුතුය. ස්ථිරව පිහිටුවාගන්න කර්මාන්ත ගැණ පනවා තිබෙන 52වෙනි නියෝගය කලකට පිහිටුවාගත් කර්මාන්තවලටත් භාවිතාවේ.

### ලයිම්ලයිට් එළිය.

73වෙනි නියෝගය.—ලයිම්ලයිට් එළිය පාවිච්චිකරණ සෑම ප්‍රස්ථාවවල් වලදී මෙහි පහත දක්වන පංගාඩම් සැලකිය යුතුය.

(a) සභාපතිතුමා කැමැතිවෙන පරිද්දෙන් සෑම භාජන ඇට්මොස්පියර්ස් 224ක තදකම තිබීමට පරීක්ෂාකර තබාගත යුතුය. තවද ඔහුට සුදුසුයයි සිතෙන හැටියට කලින්කලට එය විභාගකර බැලීමට නියමකරන්ට පුළුවන.

(b) හයිඩ්‍රෝජන්වලින් සහ අඟුරුවලින් සාදන ගෑස් තිබෙණ භාජනවලට යමක් යාකරණ පිණිස එහි වම්පැත්තේ නූල් හෝ කම්බි ඇතිවිය යුතුය. තවද එය රතුපාටින් පින්තාරු කළයුතුය.

(c) සෑම භාජන ඒත්තුගත් පරීක්ෂාකරබලන යන්ත්‍රයක් ඇතුව පාවිච්චිකළ යුතුය.

(d) සෑම භාජන යකඩ පයිප්වලින් හෝ කැන්වස් රෙදි සහ කම්බි එතීමෙන් පිටින් ආරක්ෂාකරගත් රබර් නලවලින් ලංතෑරුමට ගැලපෙන ලෙස එකතුකළ යුතුය. කෘත්‍යකරණ අයගේ හෝ ලංතෑරුම ලඟ සිටින අයගේ යාම් ඊමෙන් යමක් නොවන ලෙස ආරක්ෂාවීමට පිළිවෙළකට එය තැබියයුතුය.

(e) සෑම ලයිම්ලයිට්වලට පාවිච්චිකරණ උපකරණ සභාපතිතුමා විසින් ඒත්තුගන්ට යෙදෙන සමර්ථ අයෙක් භාරව හෝ ඔහු විසින් නියමකරණ අයෙක් භාරව තිබිය යුතුය.

(f) තදින් භාජනවල රැස්කර තිබෙන ගෑස් ඇර වෙනත් ගෑස් පාවිච්චිනොකළ යුතුය. එය පාවිච්චිකිරීම තදින්ම තහනම් කරනු ලැබේ.

74වෙනි නියෝගය.—ගෑස් පත්තුකරණ ප්‍රස්ථාවල්වලදී මෙහි පහත දක්වන පංගාඩම් සැලකිය යුතුය.

(a) ෆුට්ලයිට් සහ ජ්ලෝර්ස් නමැති එළි සවිකරණලද කම්බි ආවරණවලින් ආරක්ෂාකළ යුතුයි.

(b) අංශවල තිබෙණ ගෑස් බර්නි පෙළවල් (මෙය ස්ටේජ්එකේ මට්ටමේ සිට අඩුවශයෙන් අඩි 4කින් පටන්ගත යුතුය.) සවිකරණලද යකඩ කම්බි ආවරණවලින් ආරක්ෂාකළ යුතුය.

(c) සෑම බැටන්ස් එළි අඩුවශයෙන් කම්බි තුනකින් එල්ලිය යුතුය. තවද යකඩ රාමුවකට සවිකරණලද ඝණ ලෝහ ආවරණයකින් සහ කම්බියකින් පස්සෙන් ආරක්ෂාකළ යුතුය. මෙය තිර සහ හැරහිලිත් රත්නොවන ලෙස ගෑස් ගිනිදළුවලට උච්චතාකරම ඈතින් තැබිය යුතුය.

(d) සෑම එහාමෙහාකරන්ට පුළුවන් එළි නැවියහැකි නළයකින් සවිකළ යුතුය. සෑම කරුණුවලදීම ස්ටේජ්එකේ තිබෙණ සහ නැවියහැකි නළයෙන් තිබෙණ ක්‍රමයෙන් ගෑස් නිවන්ට පුළුවන්ව තිබෙන්ට ඕනෑය.

(e) සෑම නැවියහැකි නළවල පිටින් එන බරක් නවත්වාගැනීමට හැකි සෑහෙන ශක්තියක් ඇතිවිය යුතුය.

(f) එම ස්ථානයේ සන්බර්නර්එකක් තිබේනම් ඊට තවත් එළියක් සපයා දිය යුතුය. එය ස්ටේජ්එකේ සිට පත්තු කරන්ට පුළුවන් ආකාරයකට තැබිය යුතුය.

### වැසිකිලි සපයාදීම.

75වෙනි නියෝගය.—එම ස්ථානයේ පිරිමින්ට සහ ගෑනුන්ට පාවිච්චිකිරීමට වෙන්කර සෑහෙන තරමට වැසිකිලි සහ පිරිමින්ට මූත්‍රාකරන්ට ස්ථානත් සපයා තිබෙන්ට ඕනෑය.

නැට්ටුවන්ට සහ ගායනාකාරයින්ටත් වෙන්කර සෑහෙන තරමක් වැසිකිලි ඇතිවිය යුතුය.

### කාන්දම් කම්බි.

76වෙනි නියෝගය.—එම ස්ථානයේ යම් යම් තැනකට සභාපතිතුමාට ඕනෑකරනවායයි කියා කල්පනාවේනම් ඔහු සතුටු වෙන අන්දමට ඒ ඒ තැන්වලට කාන්දන් කම්බි සපයන්ට ඕනෑය.

77වෙනි නියෝගය.—(a) සභාපතිතුමාට විශ්වාස කළහැකි කරුනු පිට ඔහුට යුතුයයි කල්පනාවේනම් පෙන්වන්ට අදහස්කර සිටින යම් ක්‍රීඩාවක් අවසරයක් නැතුව පෙන්වන්ට බැරිහැටියට නියම කළහැකිය. තවද විශෙෂ හෝ සාමාන්‍ය දුන්වීමකින් අවසරයක් ගන්නතුරු එම ප්‍රසිඩ ක්‍රීඩාව පෙන්වීම තහනම්කරන්ට ඔහුට පුළුවන.

(b) 75 (a)වෙනි නියෝගයේ ප්‍රකාර යම් ප්‍රසිඩ ක්‍රීඩාවක් දක්වන්ට තහනම්කළවිට එය පෙන්වන්ට කැමතිව සිටින අය සභාපතිතුමාගෙන් අවසරයක් ඉල්ළුම්කළ යුතුය. එම අවසරය ලැබෙනතුරු යමෙකුට එය දක්වන්ටවත් ඊට ආධාර කරන්ටවත් ඉඩදෙන්ටවත් බැරිය. අවසරය ඉල්ලා සිටින අය ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ ඔහු පෙන්වන්ට අදහස්කර සිටින ක්‍රීඩාවේ අන්දමත්, ඔහුගේ නමත් පදිංචි ස්ථානයත් සභාපතිතුමාට දැනගන්ට ඕනෑකරණ වෙනත් කරුනුත් විස්තර කළයුතුය.

78වෙනි නියෝගය.—අවසරයක් දීම පිණිස ඉල්ලුම්පත්‍රයක් ලැබුනකල සභාපති තුමාට ඔහුට හෝ ඔහු විසින් සඳහන් කරණ වෙන කෙණෙකුට ඉල්ලුම්කාරයා පෙන්වන්ට කැමැතිව සිටින ප්‍රසිඩ ක්‍රීඩාව හෝ එහි විස්තර දක්වන්ට හෝ ඔප්පුකර සිටින්ට කියා ඉල්ලාසිටිය හැකිය.

79වෙනි නියෝගය.—සභාපතිතුමාට 75වෙනි නියෝගයේ සඳහන්කර තිබෙන ඉල්ලුම්පත්‍රය සහ 76වෙනි නියෝගයේ ඇති අන්දමේ විස්තරත් කල්පනාකර බලා ඔහුගේ කල්පනාවේ හැටියට අවසරයක් දියහැකිය. එබඳු අවසරයක් සාමාන්‍ය වශයෙන් මෙහි යාකර තිබෙණ B අක්ෂරය දරණ ෆෝර්මේ හැටියට විය යුතුයි. එහි දක්වන්ටයන ක්‍රීඩාවේ ස්වභාව සහ එහි විස්තරද, ප්‍රදර්ශනය ගැණ වගකියන අය හෝ අයවළුන්ගේ නම්ද දක්වන ස්ථානයද මොනයම් පැය අතරතුරේ ඥනුද එහි සටහන්විය යුතු පොරොන්දුත් විස්තර කළයුතුය.

ප්‍රසිඩ ක්‍රීඩාවක් දක්වීමට අවසරදුන්කල එහි කියාතිබෙන පොරොන්දු කඩකර කිසිවෙකුට එය දක්වන්ටවත් ඊට ඉඩ දෙන්ටවත් කරවන්ටවත් ඊට ආධාරකරන්ටවත් බැරිය.

80වෙනි නියෝගය.—77වෙනි නියෝගයේ ප්‍රකාරයට දෙනලද අවසරයක් ඕනෑවිටක අහක්කර දමන්ටත්, කලකට නවත්වා තබන්ටත් එහි බලය අඩුකරන්ටත් සභාපතිතුමාට ඔහුගේ කල්පනාවේ හැටියට පුළුවන.

81වෙනි නියෝගය.—ප්‍රසිඩ ක්‍රීඩා දක්වන හෝ දක්වන්ට කැමැතිව සිටින අයගෙන් හෝ ගොඩනැගිල්ලට අවසර ගෙණ තිබෙන අයගෙන් හෝ එයින් එක්කෙනෙකුගෙන් හෝ වැඩිදෙනෙකුගෙන් සභාපතිතුමාට හෝ ඔහු විසින් සඳහන් කරණ අයෙකුට හෝ අයවළුන්ට දක්වනලද හෝ දක්වන්ට අදහස්කර සිටින ප්‍රසිඩ ක්‍රීඩාව හෝ එයින් කොටසක් හෝ අඞ්ගක් පෙන්වන්ට හෝ එහි විස්තර ඔප්පුකර සිටින්ට කියා ඕනෑවිටක ඉල්ලාසිටියහැකිය.

82වෙනි නියෝගය.—සභාපතිතුමා විසින් ඕනෑවිටක ලියවිල්ලකින් දෙන අණුවකින් යම් ගොඩනැගිල්ලකට අවසර ගත් අයෙක් හෝ වෙන අයෙක් විසින් දක්වන ප්‍රසිඩ ක්‍රීඩාවක් හෝ එයින් කොටසක් හෝ අඞ්ගක් නොපෙන්නා සිටිනලෙස තහනම්කළ හැකිය. තවද එය සභාපතිතුමා විසින් සුදුසුයයි නියම්කරන්ට යෙදෙන පොරොන්දු සහ නියමවල්වලට යටත්ව පෙන්වනලෙස නියමකරන්ටත් ඔහුට පුළුවන.

### සමූහයා තදවීම වැලැක්වීම.

83වෙනි නියෝගය.—(a) ගොඩනැගිල්ලේ වාඩිවෙනහැකිය සම්පූර්ණවූනාම ඒ බව අඟවා දැන්වීම ඉඩමෙන් පිටත පෙනෙන්ට තැබිය යුතුය. 83 (b) වෙනි නියෝගය අන්දමට හිටගෙණ ඉන්ට අවසර දීතිබෙන අයට ඇරෙන්ට වැඩිමනත් අයට එහි ඉන්ට අවසරලත් අය ඉඩනොදිය යුතුය.

(*b*) ඒ ගැනම විශෙෂ වශයෙන් පංගාඩම්කර තිබෙන ස්ථානවල හැර වෙන තැන්වල සිටගෙණ ඉන්න අයට ඉත් ඉඩනොදිය යුතුවත් ඇර බවුත්ට පිටතට යන මාර්ග මොන අන්දමකින්වත් අවහිරකරන්ට ඉඩනොදිය යුතුය.

වසන වේලාව.

84වෙනි නියෝගය.—යම් විශෙෂ ප්‍රස්ථාවකට සභාපතිතුමාගෙන් ඒගැනම අවසරයක්ගෙණ මිස නැතුවානම් උදේ 1කෙන් පසු මොන යම් ක්‍රීඩාවක්වත් නොපැවැත්විය යුතුය.

හසුරුවා පවත්වාගැනීම.

85වෙනි නියෝගය.—කළමනාකාරතැනට මත්වී සිටින කෙණෙක් ඇතුල්කරගන්ටවත් එහි නැවති ඉන්ට දෙන්ට වත් බැරිය.

86වෙනි නියෝගය.—සභාපතිතුමා හෝ පොලිසියේ කොළඹ පලාතේ සුපිරින්ටැන්ඩන්ට්තැන විසින් ඊට ලියවිල්ලකින් බලය දෙන අයවළුන්ට අවසරලත් ස්ථානය සෝදිසිකිරීමට සහ මෙම නියෝග ඉෂ්ටකරනවාද යන බව දැනගැනීමට එහි සෑම වේලා වල්වලදීම නිදහස්ව ඇතුල්වීමට ඉඩදිය යුතුය.

87වෙනි නියෝගය.—මෙම උපාධ්‍යනීති හෝ මෙම උපාධ්‍යනීතිය පිට සභාපතිතුමා විසින් කරණ මොනයම් අණක් හෝ තහනමක් ක්ඩකර ක්‍රියාකරණ අය වරදකාරයෙක් විමෙන් (*a*) රුපියල් 50ක් වනතුරු වැඩිකළහැකි දඩයකටද, පළමු වරදකාරයාවුන දින පටන් එම කඩකිරීම කෙරීගෙණ යන කාලය තුළ එක දවසකට රුපියල් 25 බැගින් වැඩිකළ හැකි දඩයකටද, (*b*) සභාපතිතුමා විසින් ලියවිල්ලකින් කඩකිරීම නවත්වන්ට කියා දෙන දැන්වීම ලැබුනාට පසු වරද කෙරීගෙණ යන කාලයතුළ එක දවසකට රුපියල් 25හ බැගින් වැඩිකළහැකි දඩයකටද දඬුවමක් වශයෙන් ඔහු යට හත් විය යුතුය.

ඉහත කී නියෝග පොදු ජනයා ඇතුල්නොකරණ පුද්ගලික ඉඩමක කරණ ක්‍රීඩාවල්වලට භාවිතා නොවේ.

---

මුල් අවසරපත්‍රය.

ප්‍රසිඩ ක්‍රීඩා දැක්වීම් සම්බන්ධ වර්ෂ 1912ඒ 7වෙනි ආඥාපණතේ 4වෙනි නියෝගය යටතේ දෙන A පෝර්මේ ආකාර අවසරපත්‍රය.

1. අවසරලත් අයගේ නම සහ පදිංචි ස්ථානය : ——.
2. අවසරලත් ඉඩමේ කළමනාකාරයාගේ නම සහ පදිංචි ස්ථානය : ——.
3. අවසරලත් ඉඩම පිහිටා තිබෙන අන්දමත් එහි විස්තරත් : ——.
4. අවසරලත් ඉඩමේ මහත : ——.
5. එක වතාවකට ඇතුල්කරණ අයවළුන්ගේ ගණන : ——.
6. ඉදගන්ට පිළියෙළකර තිබෙන සම්පූර්ණ මහත : ——.
7. ඉඩම විවෘතකර තිබෙන්ට ඕනෑ කාලය : ——.
8. එය පාවිච්චිකරන්ට ඕනෑ කරුනු : ——.
9. සපයා දියයුතු පිටතට යන දොරකඩවල්වල සම්පූර්ණ ගණන : ——.
10. ගෙවී මුදල් ගණන : ——.
11. අවසරපත්‍රය ඉවරවෙන දින : ———.
12. 3 වෙනි නියෝගය යටතේ අවසර දෙන බලයලත් මූලාදැනියා විසින් දෙන විශෙෂ නියමවල් : ——.

මෙහි පහත දක්වන පොරොන්දුවලට යටහත්කර මෙම අවසරපත්‍රය දෙනුලැබේ:—

(1) අවසර දෙන මූලාදැනියාගේ අවසර නැතුව ලයිසන්ස්පත්‍රය වෙන කෙනෙකුට පවරන්ට බැරිය.
(2) එක වතාවකට 5වෙනි කොලොම් එකේ සදහන්කර තිබෙන ගණනට වඩා වැඩිදෙනෙක් ඇතුල් නොකළ යුතුය.
(3) 9වෙනි කොලොම් එකේ කියා තිබෙන පිටතට යන දොරකඩවල් නියෝගවල්වල කියා තිබෙන ආකාරයට පවත්වාගත යුතුය.
(4) 7වෙනි කොලොම් එකේ කියා තිබෙන වේලාල්වල ඇර අනිත් වේලාවල්වලදී ඉඩම ඇර තියන්ට බැරිය.
(5) 8වෙනි කොලොම් එකේ කියා තිබෙන කටයුතුවලට ඇර වෙන ඒවාට ඉඩම පාවිච්චි නොකළයුතුය.
(6) 12වෙනි කොලොම් එකේ කියා තිබෙන නියමවල් පිළිපැදිය යුතුය.
(7) පොදු ජනයාගේ සුශීලාචාරයට නොගැළපෙන මොනයම් ෆිල්ම් එකක්වත් නොපෙන්විය යුතුය.

ස්ථානය : ———. අත්සන : ———.
දිනම : ———. තනතුර . ———.

අවසරලත් අයගේ අත්සන : ———.

---

ප්‍රසිඩ ක්‍රීඩාවල් සම්බන්ධ වර්ෂ 1912ඒ 7වෙනි ආඥාපණතේ 77වෙන් නියෝගය යටතේ දෙන B පෝර්මේ ආකාර අවසරපත්‍රය.

1. ප්‍රසිඩ ක්‍රීඩාව දැක්වීම ගැණ වගකියයුතු අය : ——.
2. ප්‍රසිඩ ක්‍රීඩාව පෙන්වන ස්ථානය : ——.
3. එය දක්වන්නේ මොනයම් පැය අතරේද යනු : ——.
4. ප්‍රසිඩ ක්‍රීඩාවේ අඳුම සහ එහි විස්තර : ——.
5. අවසරය දෙන මූලාදැනියා විසින් දෙන විශෙෂ නියම වල් : ——.

---

මෙහි පහත දක්වන පොරොන්දුවලට යටහත්කර මෙම අවසරය දෙනුලැබේ :—

(1) අවසර දෙන මූලාදැනියාගේ අවසරය නැතුව ලයිසන්ස්පත්‍රය වෙන කෙනෙකුට පවරන්ට බැරිය.
(2) 2වෙනි කොලොම් එකේ සදහන්කර තිබෙන ස්ථානයේ සහ 3වෙනි කොලොම් එකේ සදහන්කර තිබෙන පැය අතරේ මිස වෙන වේලාවක ක්‍රීඩාව නොපෙන්විය යුතුය.
(3) 4වෙනි කොලොම් එකේ විස්තරකර තිබෙන ක්‍රීඩාවට වෙනස් එකක් නොපෙන්විය යුතුය.
(4) 5වෙනි කොලොම් එකේ කියා තිබෙන විශෙෂ නියමවල් පිළිපැදිය යුතුය.

ස්ථානය : ———. අත්සන : ———.
දිනම : ———. තනතුර : ———.

අවසර දෙන බලයලත් මූලාදැනියා : ———.

---

## උපාධ්‍යනීති.

යාපනේ ලෝකල් බෝර්ඩ් සභාව විසින් නගර පාඨශාලා සම්බන්ධ වර්ෂ 1906යේ ආඥාපනතේ 7 (1) යන කාණ්ඩය යටතේ සාදනලදුව 1917ක්වූ සැප්තැම්බර් මස 14වෙනි දින සහ නො. 6,898 දරන ආණ්ඩුවේ ගැසැට් පත්‍රයෙහි ප්‍රසිඩකරනලද අතුරු පනත්වල නො. 1 සහ 2 දරණ අතුරුපනත් වෙනුවට එකී පාඨශාලා ආඥාපනතේ 7වෙනි කාණ්ඩය යටතේ මෙහි පහත දක්වන අලුතුකරනලද ආඥාපනත් එකී ලෝකල් බෝර්ඩ් සභාව විසින් සාදනලද බවද, එම අතුරුපනත් කාරක මන්ත්‍රී සභාවේ සම්මතය ඇතුව වැඩබලන උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලද බවද මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් විසින.

වර්ෂ 1918ක්වූ ජූලි 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

ඉහත සදහන්කළ අලුතුකරණලද අතුරුපණත්.

1. මේ අතුරුපණත්වල "පිරිමි ලමයා" "ගෑණු ලමයා" "ලමයා යන වචනවල අදහසනම්, මීට යාකරණලද "ඒ" අක්ෂරය දරණ ලේඛනයේ සදහන් ප්‍රදෙශය තුළ පදිංචි පිරිමි ලමයෙක් හෝ ගෑණු ලමයෙක් හෝ ලමයෙක්ය.

"දෙමව්පියෝ" යන වචනයට ලමයෙකුගේ භාරකාරයෙක් හෝ ලමයෙක් භාරව සිටින කෙනෙක්ද ඇතුලත්ය.

"ව්‍යවස්ථා පොත" යන්නෙන් කාර්‍ය්‍යසම්පාදක මන්ත්‍රණ සභාවෙහිදී ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් අනුමත කරනලද්දාවූ එකලට වලංගුවූ ආධාරදීමේ පාඨශාලා සම්බන්ධවූ ව්‍යවස්ථා පොත හැයේ.

"පාඨශාලාවට පැමිණීම" යන්නෙන් ව්‍යවස්ථා පොතේ නියමකර තිබෙන අන්දමට පැමිණීම සටහන්කරණ ලේඛනයක පැමිණ සිටීමේ සම්පූර්ණ කාලයක් හැටියට ව්‍යවස්ථා පොතේ නියමකර තිබෙන කාලය තුළ පැමින සිටීම හැයේ.

"පලාතේ බලකාරතැන යන්නෙන්" අදහස්කරන්නේ යාපනේ නගර සභාවය.

"පාඨශාලාව යන්නෙන්" මීට යාකරණලද 'බී' අක්ෂරය දරන ලේඛනයේ සඳහන්වෙන්නාවූ පාඨශාලාවක් හැයේ; තවද යම් පාඨශාලාවක් මින්මතු 'බී' ලේඛනයට ඇතුළත්වෙන්නාවූ හෝ යාකරන්නාවූ යම් පාඨශාලාවල්ද ඒවා ඇතුළත්වේ.

"ළමයෙකුගේ ඉගැන්වීමට ප්‍රමානවූ සහ යෝග්‍යවූ පිළිවෙත් සාදගැන්ම සැලකියයුතු බාධාව යන මේවායින් 1906යේ නගර පාඨශාලාවල් සම්බන්ධ ආණ්ඩුපණතේ 8. 1. බී. යන වගන්තියේ විස්තරකර තිබෙන අර්ථ හැයෙන්.

"පාඨශාලා පරීක්ෂකතැන" යන්නෙන් උතුමාණන්වහන්සේ විසින් පත්කරණලද පාඨශාලා පරීක්ෂකයෙකු හෝ හැයේ.

2. වයසින් අවුරුදු හයකට අඩුනොවන්නාවූද අවුරුදු 12කට වැඩිනොවන්නාවූද පිරිමි ළමයෙකුගේ දෙමව්පිය කෙනෙක් විසින්ද වයසින් අවුරුදු හයකට අඩුනොවන්නාවූද අවුරුදු දහයකට වැඩිනොවන්නාවූද ගැණු ළමයෙකුගේ දෙමව්පිය කෙනෙක් විසින්ද එබඳු පිරිමි ළමයෙකුට හෝ ගැණු ළමයෙකුට ඉගැන්වීමට ප්‍රමාණවූ සහ යෝග්‍යවූ පිළිවෙළක් යොදාගෙන තිබුනොත් මිස නොහොත් ළමයින් පාඨශාලාවට පැමිණීමට සැලකියයුතු බාධාවක් තිබුනොත් මිස එසේ නැතහොත් එබඳු පිරිමි ළමයෙක් හෝ ගැණු ළමයෙක් මීට යාකර තිබෙන 'බී' ලේඛනයේ සඳහන්වෙන පාඨශාලාවකට හෝ මින්මතු ඇතුළත්වෙන්නාවූ යාකරන්නාවූ පාඨශාලාවකට යැවිය යුතුයි.

---

## ආණ්ඩුවේ ඉඩම් බදුදීම හෝ විකිණීම සඳහා දැන්වීම.

**No. 2,042, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 12වෙනි දිනට හෝ ඊට මත්තෙන් අනුරාධපුරේ කච්චේරියේදී මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබෙලි වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 22වෙනි දින පටන් කාලසීමාවක් නොමැතිව බදුගැනීමට ඉල්ලා ලියාඑවනලද ඉල්ලුම්පත්‍ර භාරගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරණ අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචියද සඳහන්නොකර ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත අක්කරේකට රුපියල් තුන බැගින් මුදල් තැන්පත්කොට තැබිය යුතුවේ. එසේ මුදල් තැන්පත් නොකරන්නේ නම් ඒ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද නියම්කළ්ටවිට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරණවායයි ඒජන්ත උන්නාන්සේ විසින් නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත් කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබේ. උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම්වල බද්ද ආණ්ඩුවේ බදු සම්බන්ධ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 21වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකරන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට සුදුසුවන්නේ ඉහතකී ප්‍රකාරයට කලින් මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවලුන්ට පමණකි. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම්, හුරුළු සහ කලාගම් පලාත්වල පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

සිතියම 4,946. ගම—මහපොතානකෝරලේ විත්කන්පොතාන. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. රූ. ප. | කාන්තේරු මිල් මුදල, රු | අක්කරයකට අවුරුද්දකට වැටෙගන බද්ද, රු. ශ. |
|---|---|---|---|---|---|
| 1 | පලුගහභූඩම .. | .. වියට | .. 11 0 8 | .. 70 | .. ·90 |
| | සිතියම 5,114. ගම—උඩුරුවකෝරලේ වන්නේගම. | | | | |
| 1 | වන්නේගමකැලේ .. | .. වියට | .. 26 1 24 | .. 105 | .. ·90 |
| 2 | එම .. | .. එම | .. 4 3 22 | .. 24 | .. ·90 |
| | සිතියම 201. ගම—එප්පාවලකෝරලේ මදුරුවාගම. | | | | |
| 1g | මදුරුවාගමමූකලාන | .. වියට | .. 40 1 19 | .. 345 | .. 3* |
| | සිතියම 258. ගම—කනදරකෝරලේ කොම්බිච්චිකුලම. | | | | |
| 1s | කොම්බිච්චිකුලමමූකලාන | .. වියට | .. 23 2 25 | .. 143 | .. 3† |
| 1t | එම .. | .. එම | .. 4 2 35 | .. 40 | .. 3† |
| 1y | එම .. | .. පොලට | .. 75 1 10 | .. 466 | .. 3 |
| 1z | එම .. | .. එම | .. 476 1 21 | .. 2,865 | .. 3 |
| | සිතියම 330. ගම—කනදරකෝරලේ අතුරුවෙල. | | | | |
| 2i | පලුගහභූඩම .. | .. වියට සහ පොලට | .. 10 2 35 | .. 70 | .. 1·20‡ |

* මෙම බිම්කව්විය විකුණන්නේ මෙහි කියන පොරොන්දුපිටය —බදුකාරයා හෝ බදුකාරයෝ ආණ්ඩුව විසින් යම් කාලයකදී නියමකරණ බදු ගෙවන්ට ඕනෑය. කලාවැව සෝධයාඇල යටතේ දැනට තිබෙන අයිත් ඉඩම්වලට වඩා බදු වැඩිකරන්නේ නැත කියා ආණ්ඩුව පොරොන්දුවකින් බැඳෙන්නේ නැත. දැනට මේ ඉඩමට අවුරුද්දකට අක්කරයකට රුපියල් 2 බැගින් බදු ගෙවීමට යටත්ය.

† මෙම ඉඩම් විකුණන්නේ මෙහි කියන පොරොන්දුපිටය —බදුකාරයා හෝ බදුකාරයෝ ආණ්ඩුව විසින් යම් කාලයකදී නියමකරණ බදු ගෙවන්ට ඕනෑය. නුවරවැව යටතේ දැනට තිබෙන අයිත් ඉඩම්වලට වඩා බදු වැඩිකරන්නේ නැත කියා ආණ්ඩුව පොරොන්දුවකින් බැඳෙන්නේ නැත. දැනට මේ ඉඩම්වලට අවුරුද්දකට අක්කරයකට රුපියල් 1 බැගින් බදු ගෙවීමට යටත්ය.

‡ මෙම බිම්කව්විය විකුණන්නේ මෙහි කියන පොරොන්දුපිටය.—බදුකාරයා හෝ බදුකාරයෝ ආණ්ඩුව විසින් යම් කාලයකදී නියමකරණ බදු ගෙවන්ට ඕනෑය. නාච්චාදූව යටතේ දැනට තිබෙන අයිත් ඉඩම්වලට වඩා බදු වැඩිකරන්නේ නැත කියා ආණ්ඩුව පොරොන්දුවකින් බැඳෙන්නේ නැත. දැනට මේ ඉඩමට වැඩකළ කන්නට අක්කරයකට රුපියල් 2 බැගින් ගෙවිය යුතුයි. වතු ඉඩම්වලට අවුරුද්දකට අක්කරයකට රුපියල් 3 බැගින් ගෙවිය යුතුයි.

බදු කොන්දේසි.

(a) මෙම බිම්කව්වි කාලසීමාවක් නොමැතිව බදුදෙනුලැබේ.

(b) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මිල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(c) උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(d) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව හෝ කොන්දේසිවලට විරුද්ධව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තක කරණුලැබේ.

(e) යම් ගොවිතැනක් කිරීම පිණිස බද්ද ගන්නාලද්දේද එම ගොවිතැනට වුවමනා ගොඩනැගිලි පමණක් සාදා ගැනීමට අවසර දෙනුලැබේ.

(f) බදුකාරයා විසින් මෙම ඉඩම් අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම $\frac{1}{10}$ පංගුවක් වැවීමටද, තවත් අවුරුදු 5ක් ඇතුළතදී මුළු ඉඩමෙන් තවත් හතරෙන් පංගුවක් වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුනයක් අයකරණුලැබේ.

(g) අවුරුදු 30කට වරක් බද්ද අලුත්වැඩියාකෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිවාවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.

(h) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් ලබාගෙනොගෙන බද්ද වෙන කෙනෙකුට පැවරීමටවත්, එහි අයිතිවාසිකමක් හිමිකරදීමටවත්, ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම බදු ඉඩම් ගැන වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජුලි මස 6වෙනි දින කොළඹ
මහලේකම්කාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස් පැග්ඩන්,
වැඩබලන මහලේකම්කාරිස් වහන්සේ.

---

**No. 4,724, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 17වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 11ට මදවච්චියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය පලාතේ නුවරගම් කෝරළයේ කඩවත්කෝරළේ කොටසෙයේ පිහිටා තිබෙන බිම්කැබෙලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 637.—නෙළුගොල්ලෑව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1f | අන්දරකැලේ | .. ආණ්ඩුව, කේ. වී. ජී. කිරිහාමි විසින් ඉල්ලුම්කර තිබේ | .. හේන | .. 2 0 1 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 50 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, එහේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජුලි මස 10වෙනි දින කොළඹ
මහලේකම්කාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්කාරිස් වහන්සේ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උඩබුලත්ගම ගොන්දෙන්නාවේ ගැණු පාඨශාලාවේ ප්‍රයෝජනය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මනාපය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 6,861. ගම—වරකාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගොඩමන්නෙන්හේන | .. ගැණු සෙකොලය සහ වත්ත | .. මියුසියස් හිඟින් නෝනා | .. 0 0 14·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 20වෙනි දින පෙරවරු 11.30ගේ කනිසමට නාවලපිටියේ ලෝකල්බෝඩ් කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජුලි මස 12වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝගන්,
ආණ්ඩුවේ ඒජන්ත වහන්සේ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තලපාවල ගැණු සෙකොලය සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මනාපය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 10,906. ගම—වෙහෙලගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වල සහ වත්ත | .. වත්ත | .. එච්. ඩබ්ලිව්. කේ. දිසන් සහ තවත් .. | .. 0 0 8·3 |
| 2 | එම | .. එම | .. ඩබ්ලිව්. ජේම්ස් සහ තවත් .. | .. 0 3 7·5 |
| 3 | එම | .. එම | .. එච්. ඩබ්ලිව්. කේ. හින්අප්පු .. | .. 0 0 12·2 |
| 4 | එම | .. එම | .. එච්. ඩබ්ලිව්. කේ. දිසන් සහ තවත් .. | .. 0 0 7·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 10වෙනි දින දවල් 11ගේ කනිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජුලි මස 6වෙනි දින
මාතර කච්චේරියේදීය.

පී. රීඩ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දික්වැල්ල සෙකොලය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මනාපය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ 10,910. ගම—දික්වැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පරනගොඩයේවත්ත | .. වත්ත | .. පී. සී. ඇම්. අබ්දුල් රහිමනන් සහ තවත් අය | .. 0 1 15·3 |

එබැවින් ඉඩම අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 13වෙනි දින දවල් 10යේ කනිසමට දික්වැල්ල තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජුලි මස 8වෙනි දින
මාතර කච්චේරියේදීය.

පී. රීඩ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[හම්බන්තොට දැන්වීම නො. 6,950.]

වම් 1918ක්වූ ජූලි මස 12වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඒ. ඇල්. ක්‍රොස්මන් උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණබව මෙයින් දැනගත යුතුයි.

ඒ. ඇල්. ක්‍රොස්මන්,
ඉඩමේ තොරතුරු. විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ තාරපේරිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 275 මුල් සිතියමේ 28 F 1න් පෙනෙන පර්චස් 3ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් දෙවට (පාර) කියන නොහොත් ඒ නමින් දැනගත තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට අඹලකොඩිතුවක්කුගේ ගුනසින් සහ තවත් අය විසින් වගකියන මාරගහවත්ත හෙවත් වළකඩෙවත්තද; නැගෙණහිරට ලොකුපෙට්ටිමුදලිගේ දෙන් තෝමිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන ගුරුගෙදෙනියද; දකුණට අඹලකොඩිතුවක්කුගෙ ගුනසින් සහ තවත් අය විසින් අයිතිකම්කියන මාතගෙවතතද; බස්නාහිරට අඹලකොඩිතුවක්කුගෙ දෙන් ජුවානිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන මානගෙඋස්වතතද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1304වෙනි පිටේ ප්ලෑනය බලනු.

[හම්බන්තොට වී. ම. 9—1918.]

---

[කුරුනෑගල දැන්වීම නො. 6,951.]

